010

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11	විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව	පත්‍රය / வினாத்தாள் / Paper: I	කාලය / காலம் / Time: පැය 01

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

---

(01) විටමින් D ඌනතාවයෙන් පෙළෙන ළමයෙකු හට වඩාත් සුදුසු ආහාරයක් වනුයේ,

(1) බිත්තර සුදු මදය ය. (2) හාල්මැස්සන් ය.
(3) මාළු අක්මා තෙල් ය. (4) ගොටුකොළ ය.

(02) කාබෝහයිඩ්‍රේට මගින් සිරුර තුළ සිදුකරන කෘත්‍යයකි,

(1) පටක වර්ධනය කිරීම. (2) ප්‍රතිශක්තිය ලබාදීම.
(3) ශරීරයේ නයිට්‍රජන් තුලනය රැක ගැනීම. (4) ශරීරයට ශක්තිය ලබාදීම.

(03) ශීතාද රෝගය ඇති වනුයේ,

(1) විටමින් A ඌනතාවය හේතුවෙනි.
(2) විටමින් B ඌනතාවය හේතුවෙනි.
(3) විටමින් C ඌනතාවය හේතුවෙනි.
(4) විටමින් D ඌනතාවය හේතුවෙනි.

(04) විටමින් K හැඳින්වෙන රසායනික නාමය වනුයේ,

(1) නැප්තාක්විනෝන් ය. (2) සයනොකොබෙලමින් ය.
(3) ටොකොෆෙරෝල් ය. (4) පිරිඩොක්සින් ය.

(05) සත්ත්ව කිරිවල හා බිත්තර සුදු මදයේ බහුලව අඩංගු ප්‍රෝටීන පිළිවෙලින්,

(1) මයොසින් හා ග්ලූටනින් ය. (2) කේසින් හා ඇල්බියුමින් ය.
(3) සෙයින් හා කේසීන් ය. (4) ඉලාස්ටින් හා ලෙගියුමින් ය.

(06) ආහාරයේ අඩංගු කාබෝහයිඩ්‍රේට ජීර්ණය ආරම්භ වනුයේ,

(1) ආමාශයේ දී ය. (2) ග්‍රහණියේ දී ය.
(3) මුඛයේ දී ය. (4) කුඩා අන්ත්‍රයේ දී ය.

(07) මිනිස් ශරීරයට අවශ්‍ය මහා ඛනිජ දෙකක් වනුයේ,

(1) යකඩ හා සින්ක් ය. (2) අයඩීන් හා පොස්පරස් ය.

(3) සෝඩියම් හා පොටෑසියම් ය. (4) කැල්සියම් හා යකඩ ය.

(08) පුද්ගලයකුට හතිය හා විඩාව යන පීඩාකාරී තත්ත්ව ඇතිවීම,

(1) ගලගණ්ඩයේ රෝග ලක්ෂණයකි.

(2) ස්ථූලතාවය නිසා අතිවන රෝග ලක්ෂණයකි.

(3) ශරීර කෘෂ වීම නිසා ඇතිවන රෝග ලක්ෂණයකි.

(4) නිරක්තිය නිසා ඇතිවන රෝග ලක්ෂණයකි.

(09) පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ක්ෂුද්‍රාන්ත්‍රයේ පිහිටි වසානාල මගින් මේද අම්ල හා ග්ලිසරෝල් අවශෝෂණය කරයි.

(2) ජීර්ණ යුෂ ස්‍රාවය කරන ඉන්ද්‍රියයන් ලෙස අන්නස්‍රෝතය, අග්න්‍යාශය හා අක්මාව නම් කළ හැකි ය.

(3) මෝල්ටේස් හා ලැක්ටේස් යනු, ආන්ත්‍රික යුෂයෙහි ඇති එන්සයිම දෙකකි.

(4) මහාන්ත්‍රය මගින් ඛනිජ, විටමින් හා ජලය අවශෝෂණය කරයි.

(10) ස්ටූ කිරීම යනු,

(1) ද්‍රව මාධ්‍යයෙන් පිසීමේ ක්‍රමයකි. (2) වාෂ්පයෙන් තැම්බීමේ ක්‍රමයකි.

(3) පීඩනයෙන් පිසීමේ ක්‍රමයකි. (4) වියළි තාපයෙන් පිසීමේ ක්‍රමයකි.

(11) ප්‍රෝටීන් කැලරි මන්දපෝෂණය පෙන්නුම් කරන රෝගී තත්ත්ව දෙක වනුයේ,

(1) රිකට්ස් හා ක්වෝෂියෝකෝර් ය.

(2) ක්වෝෂියෝකෝර් හා මැරැස්මස් ය.

(3) මැරැස්මස් හා කැරොටොමැලේෂියා ය.

(4) ක්වෝෂියෝකෝර් හා ඔස්ටියොපොරෝසිස් ය.

(12) නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහනට අනුව, සාමාන්‍ය ස්ත්‍රියකට වඩා ගර්භණී මවකට, දෙවන ත්‍රෛමාසිකයේ දී වැඩිවිය යුතු ශක්තිය, කිලෝ කැලරි ප්‍රමාණය වනුයේ,

(1) 360 කි. (2) 460 කි. (3) 475 කි. (4) 675 කි.

◆ **පහත සඳහන් දත්ත උපයෝගී කරගනිමින් 13 හා 14 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

පෝෂණ තත්වය	ශරීර ස්කන්ධ දර්ශකය
අධි බර	A
B	30ට වඩා වැඩි අගයක් වීම

(13) A හි දැක්වෙන අගය වනුයේ,

(1) 20.5 ට වැඩි අගයක් වීම (2) 23.5 ට වැඩි අගයක් වීම

(3) 25 ට වැඩි අගයක් වීම (4) 28 ට වැඩි අගයක් වීම

(14) B හි දැක්වෙන තත්වය වනුයේ,

(1) අඩු බර ය. (2) වැඩි බර ය.

(3) කෘෂ බව ය. (4) ස්ථූලතාවය ය.

(15) බටර් කේක් සෑදීමේ දී පිපුම්කාරකයක් ලෙස යොදා ගනු ලබන්නේ,
(1) ආප්ප සෝඩා ය. (2) බේකිං පවුඩර් ය.
(3) ආප්ප සෝඩා හා බේකිං පවුඩර් මිශ්‍රණය ය. (4) යීස්ට් ය.

(16) මාළු ඇඹුල් තියල් කිරීමේ දී යොදා ගන්නා පරිරක්ෂක කාරකය වනුයේ,
(1) සියඹලා ය. (2) දෙහි ය. (3) විනාකිරි ය. (4) ගොරකා ය.

(17) ශරීර ස්කන්ධ දර්ශකය සුදුසු පරාසයක පවත්වා ගන්නා පිරිමියෙකුගේ ඉන වට ප්‍රමාණය,
(1) අඟල් 32ක් පමණ වේ. (2) අඟල් 34ක් පමණ වේ.
(3) අඟල් 36ක් පමණ වේ. (4) අඟල් 38ක් පමණ වේ.

(18) ළදරුවකු උපන් විගස, මවගේ මුල් කිරි ළදරුවාට ලබාදීම ඉතා වැදගත් ය. මුල් කිරිවලින් ළදරුවාට ලැබෙන ඉතා ම වැදගත් ප්‍රයෝජනය වනුයේ,
(1) එම කිරි පහසුවෙන් ජීර්ණය වීම ය.
(2) මුල් කිරි වලින් ළදරුවාට ප්‍රතිශක්තිය ලැබීම ය.
(3) මුල් කිරිවලින් අසාත්මිකතාව ඇති නොවීම ය.
(4) මල බද්ධය වැළැක්වීම ය.

(19) ළදරුවකු මුලින් ම මව හඳුනාගෙන සිනාසෙන වයස් සීමාව වනුයේ,
(1) මාස 1 - 2 ත් අතර ය. (2) මාස 1 1/2 - 2 ත් අතර ය.
(3) මාස 2 - 5 ත් අතර ය. (4) මාස 4 - 6 ත් අතර ය.

(20) ළදරුවාගේ මොළය වර්ධනයට වැදගත් වන, මව් කිරිවල අඩංගු D. H. A යනුවෙන් හඳුන්වනුයේ,
(1) අත්‍යවශ්‍ය ඛනිජ ලවනයකි. (2) අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ලයකි.
(3) අත්‍යවශ්‍ය මේද අම්ලයකි. (4) අත්‍යවශ්‍ය විටමිනයකි.

(21) පරිණත ස්ත්‍රී ඩිම්බයක්, ඩිම්බනීහරණයෙන් පසු සජීවීව පවතින කාලසීමාව වනුයේ,
(1) විනාඩි 5 කි. (2) පැය 6 කි. (3) පැය 12 කි. (4) පැය 24 කි.

(22) ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, යොවුන් විය ලෙස සැලකෙන වයස් සීමාව වනුයේ,
(1) අවු. 10 සිට 19 දක්වා ය. (2) අවු. 09 සිට 20 දක්වා ය.
(3) අවු. 14 සිට 24 දක්වා ය. (4) අවු. 10 සිට 24 දක්වා ය.

- 23 හා 24 ප්‍රශ්න සඳහා පහත තොරතුරු උපයෝගී කරගන්න.

උසස් පෙළ සිසුන් කණ්ඩායමක් යොවුන් අවධිය පිළිබඳව සිදුකළ නිරීක්ෂණයකින් සොයාගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

A - අත් කඳට වඩා වේගයෙන් වර්ධනය වේ.
B - තර්කානුකූල චින්තනයෙන් යුක්ත ය.
C - නායකත්වය දැරීමට හැකි වේ.
D - නිර්මාණශීලීව කටයුතු කරයි.
E - ස්වියත්වයක් ගොඩනගා ගත හැකි වේ.
F - අස්ථිවල කැල්සිභවනය වේගවත් වේ.

(23) ඉහත A සිට F දක්වා ඇති වගන්ති අතරින්, යොවුන් දරුවන්ගේ බුද්ධි වර්ධනය පෙන්වන වගන්ති ඇතුළත් පිළිතුර වනුයේ,
(1) A, B හා C ය. (2) A, D හා E ය. (3) A, B හා E ය. (4) B, C හා D ය.

(24) යෞවුන් වියේ කායික වර්ධනය පෙන්වන වගන්ති ඇතුළත් පිළිතුර වනුයේ,

(1) A හා F ය. (2) A හා B ය.

(3) A, B හා E ය. (4) B, C හා D ය.

(25) ප්‍රජනක පද්ධතිය හා සම්බන්ධ උත්තේජක හෝමෝන ස්‍රාවය වනුයේ,

(1) ඩිම්බ කෝෂ මගිනි. (2) පිටියුටරි ග්‍රන්ථිය මගිනි.

(3) අධි වෘක්ක ග්‍රන්ථි මගිනි. (4) පැලෝපීය නාලය මගිනි.

(26) මාතෘ සායනවල දී නිරන්තර පරීක්ෂාවට ලක්වනුයේ, ගර්භණී මවගේ,

(1) රුධිර පීඩනය හා බර ය. (2) Rh සාධකය හා උස ය.

(3) උස හා බර ය. (4) රුධිර ඝනය හා බර ය.

(27) ළමා සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක වනුයේ,

(1) ආරය හා පරිසරය ය.

(2) දරුවාගේ උපත් බර හා ශරීරයේ දිග ය.

(3) මවගේ හා පියාගේ වයස ය.

(4) දරුවාගේ සෞඛ්‍ය තත්ත්වය හා පවුල් පරිසරය ය.

(28) කෙඳි වර්ගීකරණය අනුව විස්කෝස් රෙයොන් කෙඳි අයත් වනුයේ,

(1) කෘත්‍රිම කෙඳිවලට ය. (2) අර්ධ කෘත්‍රිම කෙඳිවලට ය.

(3) ඛනිජමය කෙඳිවලට ය. (4) සත්ත්වමය කෙඳිවලට ය.

(29) පතරොමක් භාවිත කර, ඇඳුමක් නිර්මාණය කිරීමේ දී,

(1) රෙදි පිරිමසා ගත හැකිවේ.

(2) මැහුම් වාසි නොතබා ඇඳුම් මසා ගත හැකිවේ.

(3) ඇඳුම් සඳහා රෙදි කැපීමට වැඩි කාලයක් ගත වේ.

(4) පතරොම නිර්මාණයට අනවශ්‍ය කාලයක් ගත වේ.

(30) පැතලි මූට්ටුව මැසීමේ දී යොදනු ලබන මැහුම් ක්‍රම වනුයේ පිළිවෙලින්,

(1) හීන් නූල් දුවවීම හා පිස්තුමේන්තු මැස්ම ය.

(2) හීන් නූල් දුවවීම හා ගැට පිස්මේන්තු මැස්ම ය.

(3) ගැට පිස්මේන්තු මැස්ම හා වාටි මැස්ම ය.

(4) හීන් නූල් දුවවීම හා වාටි මැස්ම ය.

(31) මැසීමේ දී භාවිත කෙරෙන ශිල්පීය ක්‍රම දෙකකි,

(1) පැතලි මූට්ටුව හා දිග් ගැස්සූ විවරය

(2) සැටින් මැස්ම හා පෙට්ටි පොලව්

(3) පිස්මේන්තු මැස්ම හා බොත්තම් කාස

(4) වාටි මැස්ම හා නැටි මැස්ම

(32) සිසුවියක් විසින් මැහුම් ක්‍රමයක් පිළිබඳව සටහන් කරන ලද වැකි කිහිපයක් පහත දැක්වේ.

- පිස්මේන්තු මැස්ම දෙකක් හෝ තුනක් යොදා මැසීම ආරම්භ කරයි.
- සමාන දිගින් යුක්තව මැස්ම යොදයි.
- දකුණු පස සිට වම්පස දක්වා මැසීම කරයි.
- පිස්මේන්තු තුනක් මසා, මැහුම අවසාන කරයි.

ඉහත තොරතුරුවලට අදාළ මැහුම් ක්‍රමය වනුයේ,

(1) නූල් ඇදීම ය. (2) සැඟි වාටි මැස්ම ය.
(3) සිහින් නූල් දුවවීම ය. (4) වාටි මැස්ම යෙදීම ය.

(33) එයා ටෙක්ස්, ජාවා, අයිඩා හා කැන්වස් වැනි රෙදි වර්ගයක් භාවිත කර, වඩාත් අලංකාරව මසාගත හැකි විසිතුරු මැහුම් ක්‍රමයකි,

(1) ලේසි ඩේසි මැස්ම. (2) බ්ලැන්කට් මැස්ම.
(3) කතිර මැස්ම. (4) බුලියන් මැස්ම.

(34) ළදරු ඇඳුමක් අලංකාර කිරීමට යෙදිය හැකි අක් සැරසිලි දෙකක් වනුයේ,

(1) බොත්තම් සහ රිබන් ඇල්ලීම ය.
(2) රිබන් සහ සී ක්වින්ස් ඇල්ලීම ය.
(3) රැළි පටි සහ බොත්තම් ඇල්ලීම ය.
(4) රැළි පටි සහ රිබන් ඇල්ලීම ය.

(35) පහත දක්වා ඇත්තේ මුල් ළමා වියේ ගැහැණු දරුවකුගේ ගවුම නිර්මාණය හා සම්බන්ධ කරුණු කිහිපයකි. මින් <u>අසත්‍ය</u> කරුණ තෝරන්න.

(1) පතරොම නිර්මාණයෙන් පසු මැහුම් වාසි තැබිය යුතු වේ.
(2) මෙම ඇඳුම් නිර්මාණයට සම්මත මිනුම් භාවිත වේ.
(3) ගවුමේ පිටුපස කුඩා විවරයක් තැබිය යුතු ය.
(4) ගවුම අලංකාර කිරීමට ගැළපෙන උපාංග යොදා ගැනේ.

(36) ප්‍රීතිමත්, සන්සුන්, සිත්කළු හා නැමෙන සුළු හැඟීමක් දනවන රේඛා වර්ගය වනුයේ,

(1) වක්‍ර රේඛා ය. (2) තිරස් රේඛා ය.
(3) අක්වක් රේඛා ය. (4) සිරස් රේඛා ය.

(37) පහත දක්වා ඇත්තේ නිවසක භාවිත වන ගෘහ භාණ්ඩ කිහිපයකි.

A - තට්ටු ඇඳ

B - බිත්ති අල්මාරිය

C - ලාච්චු සහිත ඇඳ

D - හකුලන ඇඳුම් රාක්කය

මේ අතරින් බහුකාර්යය ගෘහ භාණ්ඩයක් වනුයේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(38) කාමරයක් තුළ මුහුණට මුහුණ ලා දොර ජනේල පිහිටුවීම තුළින් ඇති කරනු ලබන වාතය සංසරණය හඳුන්වනුයේ,

(1) කෘත්‍රිම සංවාතනය ලෙස ය.

(2) විසරණය ලෙස ය.

(3) හරස් සංවාතනය ලෙස ය.

(4) සිරස් සංවාතනය ලෙස ය.

(39) ගෙබිම සැලැස්මක සංකේත ලෙස W^1, W^2, W^3 ලෙස ජනේල සංකේතනය විය. එයින් ප්‍රකාශ වනුයේ ජනේලවල,

(1) හැඩය යි. (2) සංඛ්‍යාව යි.

(3) පළල යි. (4) පියන් ගණන යි.

(40) ගෘහීය සම්පත් අතරින්, භෞතික නොවන සම්පතකි,

(1) ජලය (2) මුදල්

(3) දේපළ (4) විදුලිය

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Department of Education - Western Province Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11	විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව	පත්‍රය / வினாத்தாள் / Paper: II	කාලය / காலம் / Time: පැය 02

සැලකිය යුතුයි:
(i) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් ඡේදය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ශ්‍රී විද්‍යාකීර්ති විදුහලේ පැවැත්වීමට යෝජිත 'සිසු ප්‍රතිභා' අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා, ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර ගුරුතුමිය විසින් 10 හා 11 ශ්‍රේණි සිසුන් වෙත ආහාර හා පෝෂණය, ළමා සංවර්ධනය, ගෘහ කළමනාකරණය හා රෙදිපිළි තාක්ෂණය යන විෂය ක්ෂේත්‍ර දෙක බැගින් බෙදා දෙන ලදී. විෂය හදාරනු නොලබන සිසුන් හා ප්‍රදර්ශනය නරඹන්නන්ගේ ආකර්ෂණය ලබා ගැනීම මෙන් ම, ඔවුන් දැනුවත් කිරීම ප්‍රධාන අරමුණ වන බව ඇය සිසුන්ට පැවසුවා ය.

සිසුන් කළයුතු කාර්යයන් මෙන්ම කුටි සකස්කිරීම පිළිබඳව ද උපදෙස් හා මාර්ගෝපදේශනය ලබා දීමට ද ඇය කටයුතු කළාය. ශිෂ්‍යයෝ තම උපරිම දායකත්වය ලබා දී, ප්‍රදර්ශනය සාර්ථක කර ගැනීමට එකාමෙන් ඉදිරිපත් වී සිටිති.

(1) ප්‍රදර්ශන පුවරුවක් සකස් කිරීම සඳහා, පෝෂ්‍ය පදාර්ථ වර්ගගත කිරීමට, පහත සඳහන් පෝෂ්‍ය පදාර්ථවල ජීර්ණයේ අවසන් ඵලය සඳහන් කරන්න.
- ප්‍රෝටීන්
- ලිපිඩ

(2) අපරදිග සංස්කෘතියට අනුව ආහාර පිළිගැන්වීමේ දී, හැන්ද හා ගෑරුප්පුව තබන ආකාරය ඇඳ දක්වන්න.



(3) ආහාර පරිරක්ෂණය හා සම්බන්ධව ඉදිරිපත් කිරීමක් සඳහා, කිරි නරක්වීමට බලපාන බැක්ටීරියා විශේෂ දෙකක් නම් කරන්න.

(4) ප්‍රදර්ශන භූමියේ ආහාර පිසීමේ කුටිය තුළ, තෙල් ආලේපයෙන් පිසීම ද සිදුකිරීමට අදහස් කෙරේ. එම ක්‍රමයට සාදා ගත හැකි ආහාර වර්ග හතරක් නම් කරන්න.

(5) ප්‍රදර්ශනයට තැබීමට සුදුසු, ක්‍රියානුරූපී බවින් යුත් උපාංග දෙකක් නම් කරන්න.

(6) කෙඳි වර්ගීකරණයට අදාළ පුවරුවක ඇතුළත් කළ යුතු ශාකමය කෙඳි වර්ග හතරක් දක්වන්න.

(7) ප්‍රදර්ශනය සාර්ථක කර ගැනීමට උපකාරී වන කළමනාකරණ ක්‍රියාවලියේ පියවර හතර සඳහන් කරන්න.

(8) ඉදිරිපත් කිරීමට යෝජිත, නිවසක කොටස් දක්වෙන චිත්‍රයකට, වර්ණ ගැන්වීමට අදාළව ඇතුළත් කළ හැකි, පහත සඳහන් මූලික වදන් දෙක කෙටියෙන් පැහැදිලි කරන්න.
- වර්ණයේ වටිනාකම
- වර්ණයේ තීව්‍රතාවය

(9) යොවුන් වියේ දරුවන් ප්‍රදර්ශන කටයුතුවලට සිදුකරන කැප කිරීම තුළින් ඔවුන් තුළ ගොඩ නැගෙන සමාජීය වර්ධනය පෙන්වීමට කරුණු දෙකක් සඳහන් කරන්න.

(10) කුටියක ප්‍රදර්ශනයට තැබෙන පුරුෂ ප්‍රජනක පද්ධතියේ පුවරුවක් සඳහා, පහත දක්වා ඇති කොටස්වල කාර්යය බැගින් ලියන්න.

- වෘෂණ
- වෘෂණ කෝෂ (ලකුණු 2 × 10= 20)

(02) (1) ළමා ගවුම මැසීමේ දී ගවුම් කර මසා නිම කර ගත හැකි ක්‍රම තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) ඇඳුම් නිර්මාණයට ගන්නා රෙදිපිළි වර්ග නිෂ්පාදනයේ දී, ගබඩා කිරීමේ දී හා ප්‍රවාහනයේ දී සිදුවිය හැකි දෝෂ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) මුල් ළමාවියේ ගැහැණු දරුවකුගේ ගවුමෙහි කඳ කොටස සඳහා පතරොම නිර්මාණය කිරීමේ දී අවශ්‍ය මිනුම් සඳහන් කරන්න. (ලකුණු 04)

(03) (1) කෙටි කෑම වර්ග සකස් කිරීමට භාවිත කරන පේස්ට්‍රි වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) වියළි තාපයෙන් පිසීමේ ක්‍රම තුනක් නම් කර, ඒ එකිනෙකට උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 03)

(3) තේ කට්ටලයක් මගින් තේ පානය පිළිගැන්වීම, රූප සටහනක් මගින් දක්වන්න. (ලකුණු 04)

(04) (1) ජල සක්‍රියතාව (Water Activity) යන්න හඳුන්වන්න. (ලකුණු 03)

(2) ජාතික හා ආගමික උත්සව සහ ප්‍රියසාද වැනි විශේෂ අවස්ථා සඳහා ආහාර වේල් සැකසීමේ දී, අවධාරණය කළ යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) පහත සඳහන් පෝෂණ ඌනතාවන්හි දැකිය හැකි රෝග ලක්ෂණ හතර බැගින් සඳහන් කරන්න.

(a) විටමින් C ඌනතාව (b) ෆෝලික් අම්ල ඌනතාව (ලකුණු 04)

(05) (1) ගෘහ අභ්‍යන්තර අලංකරණය සඳහා යොදා ගන්නා උපාංග හයක් නම් කරන්න. (ලකුණු 04)

(2) භූමියක් මිලට ගැනීමේ දී ඉඩම් ඔප්පුවෙන් දැනගත හැකි කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) පවුලේ අවශ්‍යතා වර්ගීකරණය කර, ඉන් දෙකක් පිළිබඳ නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(06) (1) පුරුෂ ලිංගික හෝමෝන නම් කර, ඒවායේ කෘත්‍යයන් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) 'ආර්ථවහරණය' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(3) (a) ප්‍රජනක සෞඛ්‍ය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 01)

(b) ප්‍රජනක සෞඛ්‍ය මනාව පවත්වා නොගැනීමෙන් යොවුන් වියේ දී මුහුණ දීමට සිදුවන ගැටළු තුනක් සටහන් කරන්න. (ලකුණු 03)

(07) (1) ගර්භණී අවධියේ දී, ගැබිණි මවට බලපෑ හැකි අවදානම් තත්ත්ව තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) ස්ත්‍රී ප්‍රජනන පද්ධතියේ පහත සඳහන් කොටස්වලින් ඉටුවන කාර්යය බැගින් සඳහන් කරන්න. (ලකුණු 03)

(a) ඩිම්බ කෝෂ (b) පැලෝපීය නාල (c) ගර්භාෂය (ලකුණු 03)

(3) "දුස්සමාහිත බව" යන්න හඳුන්වා, නව යොවුන් වියේ දරුවන් දුස්සමාහිත වීමට බලපාන හේතු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)